# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/63 – 2017 නොවැම්බර් 24 වැනි සිකුරාදා – 2017.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යගම්පත්තු සුළු කොට්ඨාසයේ, අංක 1470, ඉහළ වීරකොඩියාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉහළ වීරකොඩියාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේශ්‍ය/යූඩීබී/2015/45 හා 2015.07.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මීගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 1.0117

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මීගහ කුඹුර; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මීගහ කුඹුර සහ ඉහළ වීරකොඩියාන කුඹුක්ගොල්ල වැව; දකුණට: ඉහළ වීරකොඩියාන කුඹුක්ගොල්ල වැව සහ චන්ද්‍රාවති සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත; බටහිරට: චන්ද්‍රාවති සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි මීගහ කුඹුර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/12/2014/ඊඩී/22.
2017 ජුනි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 – 157

1A – G 26663 – 12 (2017/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.